රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2004

මගේ අංකය : ආ/5/1/19
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය.
කොළඹ 07.
2004 දෙසැම්බර් මස 27 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

## 2005 අයවැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධනය කිරීම

2003.12.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2003 මගින් සංශෝධිත 1997.11.12 දිනැති අංක 2/97 (III) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ නියම කරන ලද්දා වූ . රාජ්‍ය සේවයේ සියලුම තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් වෙනුවට. මෙම චක්‍රලේඛයේ පරිශිෂ්ට I. II හා III හි දක්වා ඇති වැටුප් පරිමාණයන් 2004.12.01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ. තවද 1997.01.01 දින සිට හෝ ඊට පසු දිනක සිට අමාත්‍ය මණ්ඩලය මගින් හෝ මහා භාණ්ඩාගාරය මගින් හෝ අනුමත කර ඇත්තා වූ.. දැනට මෙම චක්‍රලේඛයේ පරිශිෂ්ට I. II හා III ට පරිබාහිර වූ වැටුප් පරිමාණයන්ද. මෙම පදනම යටතේම සංශෝධනය විය යුතුය.

02. එක් එක් සේවාවට. තනතුරට හෝ ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩයන් II වන පරිශිෂ්ටයෙහිද. එම වැටුප් කාණ්ඩයන්ට අදාළ වැටුප් පරිවර්තන වගු III වන පරිශිෂ්ටයෙහිද දැක්වේ. පරිශිෂ්ට II හි සඳහන් නොවන රාජ්‍ය සේවයේ සෙසු තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97(III) මගින් ලබා දී ඇති වැටුප් කාණ්ඩයන්ට අනුරූපී මෙම චක්‍රලේඛය යටතේ වන වැටුප් කාණ්ඩයන් යොදා ගත යුතුය.

උදා - රා.පරි.ච.2/97(III) හි ටී-2-2 වැටුප නියම කර ඇති දත්ත සටහන් ක්‍රියාකරු තනතුර සඳහා මෙම චක්‍රලේඛය යටතේ 2004.12.01 දින සිට ටීබී-2-2 වැටුප් කාණ්ඩය අදාල කර ගත යුතුය.

2004.11.30 දින වනවිට ක්‍රියාත්මකව පැවති. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් නොවන වැටුප් පරිමාණයන්ද. අයවැය යෝජනාවලට අනුකූලව වන සේ සකස් කොට. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ එකඟත්වය හා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත ක්‍රියාත්මක කළ යුතුය.

03. පියවරෙන් පියවරට තැබීමේ පදනම මත මෙම වැටුප් සංශෝධනය යටතේ ගෙවීම් කළ යුතුය. යෝජිත වැඩිවීමෙන් 50% ක් හෝ මසකට රු. 2500/- ක් යන දෙකින් වැඩි ප්‍රමාණය 2004.12.01 දින සිට ගෙවිය යුතුය. 2006.01.01 දින සිට ගෙවිය යුතු ඉතිරි ප්‍රමාණය. පරිපාලනය සඳහා වන ජාතික සභාවේ නිර්දේශයන් මත සිදු කෙරේ. පරිශිෂ්ට III හි පරිවර්තන වගුවල පෙන්නුම් කෙරෙන්නේ සම්පූර්ණ වැඩිවීම ඇතුළත් වැටුප් පියවර වන අතර. 2004.12.01 සිට ගෙවිය යුතු මුදල. ඉහත සඳහන් විධිවිධාන අනුව ගණනය කළ යුතුය. (පරිශිෂ්ට V හි ආදර්ශ බලන්න)

04. අයවැය යෝජනා යටතේ නියමිත. පවතින මූලික වැටුපෙන් සියයට හතලිහ (40%) වැඩිවීම. මසකට රු. 9000/- සීමා විය යුතු බැවින් ඊට අනුකූල වන සේ වැටුප් පරිමාණයන් කිහිපයකට. එනම් ටීබී 7. 8.10-3-1. 10-3-2 . 10-4 හා 12-6 වැටුප් කාණ්ඩයන් සඳහා ගැලපීමේ දීමනාවක් එකතු කර ඇත. එය සියලුම කාර්යයන් සඳහා වැටුපේ කොටසක් වශයෙන් සැලකේ. උසස්වීමක් යටතේ වැටුප් පරිවර්තනය කිරීමේදී . වැටුප් පියවර ලෙස සැලකිය යුත්තේ එම දීමනාවද එකතු කළ වැටුපය. වැටුප් වර්ධක ලබා දීමේදී එම දීමනාව වෙන් වශයෙන් පෙන්විය යුතුය.

05. 2004.12.01 දින සිට 2005.12.31 දින දක්වා කාලය තුළ උසස්වීමක් යටතේ වැටුප් පරිවර්තනය කිරීමේදී. සම්පූර්ණ වැටුප් පියවර යොදා ගත යුතුය. (පරිශිෂ්ට 5 ආදර්ශ 2 බලන්න) එහෙත් එම කාලසීමාව සඳහා ගෙවීම් කළ යුතු වන්නේ අදාළ ප්‍රතිශතය වැඩිවීම අනුවය.

06. වැටුප් විෂමතා

06.1 එක් එක් ආයතනවල හා එක් එක් තනතුරුවල වැටුප් පරිමාණයන් වෙන් වෙන් වශයෙන් සළකා බලමින් සිදු කර ඇති වැටුප් සංශෝධන තුලින් පැන නැගී ඇති වැටුප් විෂමතා ඉවත් කිරීමේ අවශ්‍යතාවය කෙරෙහිද රජයේ අවධානය යොමු වී ඇත. එබැවින් 1997.01.01 දිනට පසුව මෙම චක්‍රලේඛයේ 01 වන ජේදයේ සඳහන් පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් බැහැරව සිදු කර ඇති සියලුම වැටුප් සංශෝධනයන් පිලිබඳ සම්පූර්ණ විස්තර හා මෙම චක්‍රලේඛය තුලින්ද නොවිසඳී ඇති වැටුප් විෂමතා පිලිබඳ විස්තර 2005.03.31 දිනට පෙර, කොළඹ 07, බෞද්ධාලෝක මාවත, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටි පරිපාලනය සඳහා වන ජාතික සභාව වෙත යොමු කළ යුතුය.

06.2 පරිපාලනය සඳහා වන ජාතික සභාව විසින් නිරාකරණය කළ යුතුව ඇති වැටුප් විෂමතා නිවැරදි කරමින් නිර්දේශ කළ යුතු නව වැටුප් ව්‍යුහය 2005.09.30 දිනට පෙර නිර්දේශ කරනු ඇත.

07. සංයුක්ත දීමනා

සංයුක්ත දීමනාව පහත සඳහන් පරිදි 2004.12.01 දින සිට සංශෝධනය කරනු ලැබේ. 2004.12.01 දිනට පසුව වැටුප් වර්ධකයක් ලැබීම හෝ උසස්වීමක් ලැබීම හේතුවෙන් වැටුප් පියවරේ වෙනසක් සිදු වූ විට, ඊට අනුරූපී 2004.11.30 දිනට නියමිතව පැවති වැටුප් පියවර මත හිමිකම තීරණය කළ යුතුය.

| 2004.11.30 දිනට සංයුක්ත දීමනාව | සංශෝධිත සංයුක්ත දීමනාව (දිනකට) |
|---|---|
| රු. 150/- | රු.175/- |
| රු. 180/- | රු.200/- |
| රු. 230/- | රු.250/- |
| රු. 280/- | රු.300/- |

08. දීමනා

08.1 2000.09 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2000 සහ 2001.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2001 යටතේ ලබා දී ඇති අන්තර් දීමනා තවදුරටත් ගෙවිය යුතුය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2000 යටතේ 2004.12.01 දින සිට හිමිවන 10% අන්තර් දීමනාව තීරණය කළ යුත්තේ සංශෝධිත වැටුප පදනම් කරගෙනය.

08.2 රාජ්‍ය සේවයේ විවිධ ආයතන ම-ින් වැටුප පදනම් කරගෙන හෝ නියත වශයෙන් විශේෂිත කාර්යයන් වෙනුවෙන් හෝ අඛණ්ඩව මාසිකව ගෙවනු ලබන සියලුම දීමනා නැවත සමාලෝචනය කිරීමටද තීරණය කර ඇත. ඒ අනුව 2005.05.01 දිනට පසුද ගෙවීමට අවශ්‍යයයි අදහස් කරන්නේ නම්, එම දීමනා සමාලෝචනය කිරීම සඳහා, මෙම චක්‍රලේඛයේ 06 වන ජේදයේ සඳහන් පරිපාලනය සඳහා වන ජාතික සභාව වෙත යොමු කළ යුතුය.

08.3 එම සභාව ම-ින් නිර්දේශ කර රජයේ අනුමැතිය ලබා ගන්නා තෙක් දැනට ගෙවනු ලබන දීමනා 2004.11.30 දින මූල්‍ය වටිනාකමට සීමා කළ යුතු අතර, ඒවා මෙම චක්‍රලේඛය අනුව සංශෝධනය නොකළ යුතුය.

09. කාර්යක්ෂමතා කඩඉම්

දැනට පවත්නා කාර්යක්ෂමතා කඩඉම්, මෙම චක්‍රලේඛය යටතේ සංශෝධිත වැටුප් පරිමාණවල අනුරූපී පියවරයන්හිදී ක්‍රියාත්මක වේ. මේ අනුව කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු කාලය නොවෙනස්ව පවතිනු ඇත.

10. විශ්‍රාම වැටුප

10.1 2004.12.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලබා ඇති විශ්‍රාමිකයන්ට, ඔවුන්ගේ වර්තමාන මූලික මාසික අඩු නොකළ විශ්‍රාම වැටුප (දීමනා රහිත) රු. 750/- ක අවමයකට සහ රු. 1500/- ක උපරිමයකට යටත්ව 15% කින් වැඩි කර 2004.12.01 දින සිට ගෙවිය යුතුය. 2000.09.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2000 යටතේ ගෙවනු ලබන 10% ක දීමනාව 2004.12.01 දින සිට ගෙවිය යුත්තේ, එසේ ලබා දෙන වැඩිවීම සම- . නව අඩුනොකළ විශ්‍රාම වැටුප මතය. 2001.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2001 යටතේ ගෙවනු ලබන රු.750/- ක අතුරු දීමනාවද තවදුරටත් ගෙවිය යුතුය. මේ පිළිබඳ චක්‍රලේඛ උපදෙස් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් නිකුත් කෙරෙනු ඇත.

10.2 2004.12.01 දින සේවයේ සිට ඉන් පසුව විශ්‍රාම යන නිලධාරින්ගේ විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා මෙම චක්‍රලේඛය යටතේ වැඩිවන සම්පූර්ණ වැටුප යොදා ගත යුතුය.

11. වැටුප් වර්ධක

11.1 වැටුප් වර්ධක දින නොවෙනස්ව පවතී. දැනට පවතින වැටුප් පරිමාණයන් අනුව 2004.11.30 දිනට හෝ ඊට පෙර උපයාගෙන ඇති වැටුප් වර්ධක මෙම චක්‍රලේඛය යටතේ වැටුප් පරිවර්තනය කිරීමට පෙර ලබා දිය යුතුය.

11.2 2004.12.01 දින හෝ ඊට පසු උපයා ගන්නා වැටුප් වර්ධක වෙනුවෙන්. වැටුප් වර්ධකවල සම්පූර්ණ වටිනාකම ප්‍රදානය කළ යුතුය.

12. රැඳී සිටීමේ වාසි

12.1 පරිශිෂ්ට II හා III හි සඳහන් වැටුප් පරිමාණයෙන් ඔබ්බට 2003.06.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2003 අනුව රැඳී සිටීම වෙනුවෙන් වැටුප් වර්ධක ලබා දීමේදී. පහත දැක්වෙන 12.3 උපඡේදයේ විධිවිධානවලට යටත්ව වැටුප් පරිමාණයේ අවසානයට ඇති වැටුප් වර්ධක වටිනාකම මත පමණක් වැටුප් වර්ධක ලබා දිය යුතුය.

12.2 උපරිමයේ රැඳී සිටීම වෙනුවෙන් වැටුප් වර්ධක ලබමින් සිටින නිලධාරීන්ට දැනටමත් ලබා ඇති වැටුප් වර්ධක සංඛ්‍යාව. නව වැටුප් පරිමාණයට එකතු කර. පහත දැක්වෙන 12.3 උපඡේදයේ විධිවිධානවලට යටත්ව. නියමිත වැටුප් පියවර තීරණය කළ යුතුය. එම නිලධාරීන්ට 2004.12.01 දින සිට 2005.12.31 දක්වා කාල සීමාවට අර්ධ වැඩිවීම යටතේ වැඩිවන ප්‍රමාණය පමණක් ලබා දිය යුතුය.

12. 3 එසේ වුවද ඉහත 12.2 සහ 12.3 උප ඡේද යටතේ වැටුප් වර්ධක ලබා දීමේදී මාසික වැඩිවීම රු. 9000/- (අර්ධ වැඩිවීම 4500/-) උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

උදා ÷ ටිජ්-7-1 වැටුප් කාණ්ඩය යටතේ උපරිමයේ රැඳී සිටීම වෙනුවෙන් උපරිමය ඉක්මවා එක් වැටුප් වර්ධකයක් ලැබීම නිසා රු. 296520/- වැටුප් පියවරට එළඹ සිටින නිලධාරියකුට මෙම චක්‍රලේඛය යටතේ වැටුප් වර්ධක අගය වන රු. 11880/- ක් ලබා දුන් විට. රු. 407220/- ට එළඹෙන නමුත්. රු. 9000/- වැඩිවීමට සීමා වන පරිදි ලබා දිය යුත්තේ රු. 9180/- ක වැටුප් වර්ධකයකි. එවිට වැටුප් පියවර රු. 404520/- ක් වේ. එම වැටුප් පරිමාණයේ ඉන් අනතුරුව වැටුප් වර්ධක වටිනාකම රු. 9000/- බැගින් වේ.

13. අතිකාල දීමනා

2004.12.01 දින සිට ගෙවනු ලබන වැටුප මත අතිකාල දීමනා ගෙවිය හැකිය.

14. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය කර ගැනීම.

2004.12.01 දින සිට අදාළ දායක මුදල් ප්‍රතිශතයන් මෙසේය.

වාර්ෂික වැටුප රු. 124260/- හෝ ඊට අඩු - 6%
වාර්ෂික වැටුප රු. 124261/- සහ ඊට වැඩි - 7%

15. දුම්රිය ගමන් බලපත්‍ර සහ නිවාඩු ගමන්

නැවත නියමයක් කෙරෙනතුරු එක් එක් නිලධාරියාට 2004.11.30 දිනට හිමිව තිබූ නිවාඩු දුම්රිය බලපත්‍ර හිමිකම නොවෙනස්ව පවතී. එහෙත් 2004.12.01 දිනට පසුව වැටුප් වර්ධකයක් ලැබීම හෝ උසස්වීමක් ලැබීම හේතුවෙන් වැටුප් පියවරේ වෙනසක් සිදු වූ විට. ඊට අනුරූපී 2004.11.30 දිනට නියමිතව පැවති වැටුප් පියවර මත හිමිකම තීරණය කළ යුතුය.

16. රජයේ නිලධාරීන් වර්ග කිරීම

නැවත නියමයක් කෙරෙනතුරු රජයේ නිලධාරීන් වර්ග කිරීම 2004.11.30 දිනට පැවති පදනමින්ම පවතිනු ඇත. 2004.12.01 දිනට පසුව තනතුරේ වෙනසක් සිදුවුවහොත් 2004.11.30 දිනට පැවති එම තනතුරුට අනුරූපී වැටුප් පරිමාණය පදනම් කරගෙන අදාල නිලධාරීන් වර්ග කිරීම සිදු වේ.

17. දෛනික වැටුප්

දෛනික වැටුප මෙහි පරිශිෂ්ට - IV හි දක්වා ඇති පරිදි ගෙවිය යුතුය. දෛනික වැටුප ගණනය කර ඇත්තේ ආරම්භක වැටුප 30 න් බෙදීමෙනි.

18. විශ්‍රාම ලැබීමෙන් පසුව කොන්ත්‍රාත් පදනම මත නැවත පත් කරනු ලැබ ඇති නිලධාරීන්

18.1 විශ්‍රාම ලැබීමෙන් අනතුරුව කොන්ත්‍රාත් පදනම මත නැවත පත් කර ඇති නිලධාරීන්ට සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති නිලධාරීන්ට, එම කොන්ත්‍රාත් කාලය තුළ හිමි විය යුත්තේ, දැනටමත් ගිවිසගෙන ඇති වැටුප හෝ දීමනාව පමණි. 2004.12.01 දිනට පෙර විශ්‍රාම ගිය නිලධාරියකු නැවත සේවයේ යෙදවීමේදී අවසාන වරට ලද වැටුප, මෙම චක්‍රලේඛය අනුව පරිවර්තනය නොකළ යුතුය.

18.2 පහත සඳහන් පරිදි සේවයේ යොදවා ඇති නිලධාරීන්ට මෙම වැටුප් සංශෝධන හිමි නොවේ.

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/99 සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 10 හි 4:1 (බි) ඡේදය යටතේ වැටුප් රහිත නිවාඩු මත ව්‍යාපෘතිවල සේවය කරන නිලධාරීන්ට.

(ආ) රාජ්‍ය සේවයෙන් පරිබාහිරව කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘතිවලට බඳවාගෙන ඇති සහායක කාර්ය මණ්ඩලය යටතට නොගැනෙන නිලධාරීන්ට.

(ඇ) මෙම චක්‍රලේඛයේ සඳහන් වැටුපට වඩා වැඩි විශේෂ වැටුපක් මත කොන්ත්‍රාත් පදනමින් නැවත සේවයේ යොදවා ඇති හෝ බඳවා ගෙන ඇති නිලධාරීන්ට

18.3 රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල සේවය කිරීම සඳහා රාජ්‍ය සේවයේ වැටුප් පරිමාණයන් මත වැටුප් ගෙවීමේ පදනම යටතේ තාවකාලිකව මුදාහැර ඇති රජයේ නිලධාරීන්ට සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 හි 5.3 (බි) උපඡේදය යටතේ බඳවා ගෙන ඇති සහායක කාර්ය මණ්ඩල නිලධාරීන්ට මෙම චක්‍රලේඛය යටතේ සංශෝධනය වන වැටුප් පරිමාණයන් අදාල වේ.

19. ණය සහ අත්තිකාරම්

19.1 2004.12.01 දින සිට 2005.12.31 දක්වා ආපදා ණය ගෙවීමේදී 2004.11.30 දිනට අදාල වූ වැටුප පදනම් කර ගත යුතුය.

19.2 නිවාස සහ දේපළ ණය ගණනය කරනු ලබන්නේ අදාල මාසයේ ගෙවනු ලබන වැටුප පදනම් කර ගනිමිනි.

20. රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල

රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට මෙම චක්‍රලේඛයේ සඳහන් වැටුප් වැඩිවීම අදාළ කර ගැනීම පිළිබඳව මහා භාණ්ඩාගාරය විසින් වෙනම උපදෙස් නිකුත් කරනු ලැබේ.

21. වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා දායක මුදල්

2005.01.01 දින සිට රාජ්‍ය සේවයේ සියලුම ස්ථිර සේවකයන්ගෙන් මසකට රු. 75/- බැගින් වූ මුදලක් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා දායක මුදල් වශයෙන් අය කරනු ලැබේ. මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් මේ පිළිබඳ චක්‍රලේඛ උපදෙස් යථා කාලයේදී නිකුත් කරනු ඇත.

22. මූල්‍ය ප්‍රතිපාදන

``වැය විෂය 1001- වැටුප් හා වේතන`` යටතේ ප්‍රතිපාදන වලින් මෙම වැටුප් වැඩි වීම ගෙවිය යුතුය. අතිරේක ප්‍රතිපාදන සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලුම් කළ යුතුය.

23. මහා භාණ්ඩාගාරයේ එක- තාවය මත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

එස්.සී.මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය